museum of modern
and contemporary art
sri lanka

**Quarterly Newsletter #6 – January 2024**

2024 යනු MMCA ශ්‍රී ලංකා ක්‍රියාත්මකවන පස්වන වසරයි. රටේ ප්‍රථම නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය ස්ථාපිත කිරීමේ ගමනට ළඟින් හා දුරින් උපකාරකළ සියල්ලන්ට අපි ස්තුතිය පළකරමු. මෙම ගමනේ ඊළඟ පියවරට පිවිසෙන අපි ආකර්ෂණීය සැලසුම් බොහෝමයක් සූදානම් කරගෙන සිටින්නෙමු. ඒ අතරේ වැදගත් ම මතක් කිරීම නම් අපගේ සියලු ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් සියලු දෙනාට ම නොමිලේ විවෘත බවයි!

අපි 2024ට පිය නගන්නේ ගෘහ නිර්මාණ ශිල්පය කේන්ද්‍රකරගත් අපගේ පළමු ප්‍රදර්ශනයේ විවෘත කිරීමත් සමගයි. නව කෞතුකාගාරයක් ලෙස අපගේ ප්‍රදර්ශන වැඩසටහන්කරණයේ මුල් කාලයේදී ම ගෘහ නිර්මාණ ශිල්පයට විශේෂ අවධානයක් ලබා දීමට අපි උනන්දුවූයේ එය රටේ නූතන හා සමකාලීන ඉතිහාසය තුළ ඉටු කර ඇති වැදගත් කාර්යභාරය හේතුවෙනි. තිනාල් සජීව හා නිමායා හැරිස්ගේ සහයෙන් ශාමිණී පෙරේයිරා සහ රිවෙල් මාසලින් අභිරක්ෂණයකළ, ‘අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ ප්‍රදර්ශනය 2023 නොවැම්බර් 30 විවෘත විය.

ප්‍රදර්ශනය නැරඹීමට දැනට 4,000 අධික පිරිසක් පැමිණ ඇති අතර රට පුරා පාසැල් හා උසස් අධ්‍යාපන ආයතනවලින් තවත් බොහෝ සිසුන් පිළිගැනීමට අප බලාපොරොත්තු වෙමු. ඔබ ශ්‍රී ලංකාවේ සිටින්නේ නම් මෙය නැරඹීමට පැමිණෙන්න!

කොළඹ 3, ක්‍රෙස්කැට් බුලෙවාඩ්හි බිම් මහලේ පිහිටි MMCA ශ්‍රී ලංකාහි සංදර්ශිත ‘අක්කර 88’ මහජනතාව සඳහා 2024 ජූලි 7 දක්වා විවෘතයි.

නරඹන්නන්ට ප්‍රදර්ශන සමඟ නියැලීමට තවත් ක්‍රම සපයන මහජන වැඩසටහන්, ආරම්භයේ සිට ම අපගේ ක්‍රියාකරම්වල වැදගත් භූමිකාවක් ඉටුකර ඇත. ‘අක්කර 88’ සමඟ ලබාදෙන අපගේ මහජන වැඩසටහන්වලට 800 අධික පිරිසක් දැනට සහභාගීවී ඇති බව අප දැනුම් දෙන්නේ සතුටිනි. ඉරුෂි තෙන්නකෝන් (උ. 1989), සුමේධ කැලේගම (උ. 1988), හා සුමුදු අතුකෝරල (උ. 1980) විසින් මෙහෙයවන කලාකරු සංචාර මෙම වැඩසටහන්වල කැපී පෙනෙන අංගයක්වන අතර, මිනෙට් ද සිල්වා (1918–1998) විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය පිළිබඳව ඔවුන්ගේ විශේෂයෙන් පැවරුණු ‘is this an architectural documentary?’ (2023) නම් සජීවීකෘත වාර්තාමය චිත්‍රපටය ‘අක්කර 88’ ප්‍රදර්ශනයේ දැන් සංදර්ශිතයි.

අපගේ මහජන වැඩසටහන් පිළිබඳව වැඩි විස්තර සඳහා ඉහළ සපයා ඇති ලින්කු තුළින් අපගේ වෙබ් අඩවියට හෝ ඉන්ස්ටග්‍රෑම් හා ෆේස්බුක් පිටුවලට පිවිසෙන්න.

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

'අක්කර 88' වෙනුවෙන් සිදුකළ පර්යේෂණ සමඟ ශ්‍රී ලංකාවේ මහනුවර නගරයේ පිහිටි වටපුළුව නිවාස යෝජනා ක්‍රමය පිළිබඳව මෙතෙක් ප්‍රකාශයට පත් නොකළ ආකයිව ඡායාරූප හා ලියකියවිලි රැගෙන එන 'දෙවැනි වෙළුම' නම් අපගේ පළමු ප්‍රකාශනය බලාපොරොත්තු වන්න. MMCA ශ්‍රී ලංකා විසින් ප්‍රකාශිත හා බැංගලෝර්හි වෙසෙන නියා තන්ඩපානි විසින් නිර්මාණයකළ 'දෙවැනි වෙළුම', 2024 පෙබරවාරි 1 වැනිදා පෙර-ඇණවුම් සඳහා නිල වශයෙන් විවෘත වෙන අතර එය පෙබරවාරි 10 වැනිදා කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි පිහිටි MMCA ශ්‍රී ලංකාහි එළිදැක්වේ. සියල්ලන්ට ආරාධනා!

MMCA ශ්‍රී ලංකාහි ආදිකර්තෘ අනුග්‍රාහකයින් දෙසැම්බර් 8–12 දක්වා ක්වාලාලම්පූර් හා සිංගප්පූරුවට ගිය ජාත්‍යන්තර කලා සංචාරයක් සමග අපි 2023 නිමා කළෙමු. මෙම සංචාරයට ඉල්හාම් ගැලරිය, ආලියා සහ ෆාරුක් ඛාන් එකතුව, මැලේසියාවේ ජාතික කලාගාරය, සිංගප්පූරුවේ ජාතික ගැලරිය, සිංගප්පූරුවේ උරුම සංරක්ෂණ මධ්‍යස්ථානය, සහ සිංගප්පූරු කලා කෞතුකාගාරය (SAM) නැරඹීම ඇතුළත් විය.

කෞතුකාගාරයේදී අපි 2023 දෙසැම්බර් 18–21 දක්වා වයස අවුරුදු 6–10 ළමුන් සඳහා MMCA Afterschoolහි විශේෂ නත්තල් සංස්කරණයක් ඉදිරිපත් කළෙමු. 'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' හා සම්බන්ධ නව ක්‍රියාකාරකම් ඇතුළත් මෙම සැසියට ළමුන්ට තමන්ගේ ම නත්තල් ගම්මානයක් සෑදීමට මග පෙන්වූ කලාකෘති/වස්තු සෑදීම, ඇඳීම, ක්‍රීඩා, හා අත්කම් ඇතුළත් විය.